# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.08.11 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්
විධායක කමිටු/ පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් ,

**<u>කොවිඩ්-19 ව්‍යවසනකාරි තත්ත්වය හමුවේ බැංකු කළමනාකරණය කිරීම සම්බන්ධ උපදෙස්</u>**

ඉහත කරුණට අදාල මාගේ DSD/HO/05/MF/01 දරණ 2021.05.06 සහ 2021.07.01 දිනැති ලිපියට අමතරවයි.

02. සමෘද්ධි බැංකු, බැංකු සමිති, සමෘද්ධි මූලස්ථාන සහ ක්ෂේත්‍ර ගත නිලධාරින් හට නව කොවිඩ් - 19 වෛරසය රෝගී තත්ත්වයට ගොදුරු වූ විටක එම නිලධාරින් වෙනුවෙන් රු. 10,000/- අත්‍යාවශ්‍ය ආහාර මල්ලක් ලබාදීමට ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

03. මීට අමතරව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් සමෘද්ධි අංශ සහ පුහුණු ආයතනවල සේවයේ නිරත සියලුම ස්ථිර නිලධාරින්ට ද මෙම අත්‍යාවශ්‍ය ආහාර මල්ල ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එම නිලධාරින් ද බැංකු කටයුතු ප්‍රවර්ධනය සඳහා විශාල සේවය සිදු කරන බව දන්වමි.

04. නිලධාරින් ඔබ සමෘද්ධි බැංකු බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසමක ස්ථිර පදිංචිකරුවෙකු නම්, සමෘද්ධි බැංකුව වෙතින් රු. 10,000/- ක අත්‍යාවශ්‍ය ආහාර මල්ල ඔහු/ ඇය වෙනුවෙන් ද ලබාදීමට කටයුතු කරන ලෙසත් ඉන් අනතුරුව ඔහු/ ඇය සේවය කරන අංශය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලිඛිතව දන්වන ලෙසත් තවදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම ආහාර මල්ල ලබාගත් නිලධාරියා කොවිඩ්-19 වෛරස රෝගී තත්ත්වයට ගොදුරු වූ බවට සනාථ කරන සෞඛ්‍ය අංශ විසින් ලබාදෙන සහතිකයක පිටපතක් ලබාගෙන ගොනු කර තබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

06. අනිකුත් උපදෙස් සඳහා මුල් චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

07. කොවිඩ් - 19 වෛරසය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනයවීම වැලැක්වීම වෙනුවෙන් අප නිලධාරින්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට ඔබ සැම ලබාදෙන සහාය පිළිබඳ ස්තූතිවන්ත වෙමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක..ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.